Article 12(1)


# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2019-02-08 |
|---|---|---|---|

පැමිණිලිකාරිය : වයි. කුමාරගේ මිය,
නො 251/33 ඩී, කිරුළ පාර,
කොළඹ 05.

වගඋත්තරකරුවන් : 01 විදුහල්පති,
රාජකීය විද්‍යාලය,
කොළඹ 07.

02 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03 අභියාචනා මණ්ඩලයේ සභාපති,
විදුහල්පති,
ලුම්බිණි විද්‍යාලය,
කොළඹ 06.

<u>පැමිණිලි අංකය : HRC/81/18</u>

**පැමිණිල්ල :-**

මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය වන යසෙන්තා කුමාරගේ ය නඅය විසින් 2018-01-08 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ල ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම දරුවා කොළඹ රාජකීය විද්‍යාලයේ 2018 වර්ෂයේ පළවෙනි ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා ගෘහ මූලික පදනම මත අයදුම්පත්‍ර ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට සියලූ සුදුසුකම් සපුරා තිබියදීත් දරුවා පාසලට ඇතුළත් කර නොගත් බවයි.

පැමිණිල්ලට අදාළව වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරමින්, සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 65 ක් හිමිකරගෙන තේරී පත්වූ ශිෂ්‍යයින්ගේ තාවකාලික ලේඛනයේ 67 වන ස්ථානයේ සිටි බවත් ලකුණු 65 ක්




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 165, කින්සි පාර, කොළඹ - 08.<br>165, கின்சி வீதி, கொழும்பு - 08.<br>165, Kynsey Road, Colombo - 08. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011-2696470 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2696470 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@sltnet.lk |
| දුරකථන<br>தொலைபேசி | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම්<br>செயலாளர் | 011-2689558 | ක්ෂනික<br>துரித அழைப்பு | 011-2689558, 1996 | වෙබ්<br>இணையம் | www.hrcsl.lk |

ලබා ගත් තම දරුවාගේ නම අවසාන ලැයිස්තුවෙන් ඉවත් කිරීම නිසා බලවත් අසාධාරණයක් සිදුවී ඇති බවත් සඳහන් කර ඇත. එසේම දරුවාගේ පියා නාරාහේන්පිට, නො 251/33 ඩී ලිපිනයේ උපන් දා සිට ස්ථිර පදිංචිකරුවෙකු වන අතර ප්‍රසිද්ධ නොතාරිස් සරත් එන් කුරේ මහතා විසින් අදාළ දේපළ මීට වසර 14 කට පෙර ඔහු වෙත පිය උරුමයෙන් පවරා ඇති බවත් සඳහන් කර ඇති අතර. පදිංචිය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලේඛන 11 ක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණය –:**

ඉහත පැමිණිල්ලට අනුව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර ඇති අතර. එහිදී පැමිණිලි පාර්ශවය විසින් වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරමින් තමන් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 65 ක් ලබා ගෙන තාවකාලික නාම ලේඛනයේ 67 වන ස්ථානයේ ස්ථාන ගත කරන ලදුව පසුව කිසිදු දැනුම්දීමකින් තොරව ස්ථිර ලේඛනයෙන් නම ඉවත් කර ඇති බවත් ගෘහ මූලික පදනම මත ළමුන් ඇතුලත් කිරීමේ අවම ලකුණු සීමාව ලකුණු 52 ක් වන බවත් සඳහන් කර ඇත.

මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සඳහන් කර ඇත්තේ, මූලික පරීක්ෂණ වලදී පැමිණිලිකාරියගේ පදිංචිය තහවුරු වී ඇතත්, අභියාචනා හා විරෝධතා මත සිදු කල ස්ථානීය පරීක්ෂණයේදී පැමිණිලිකාරියගේ පදිංචිය තහවුරු වී නොමැති බැවින් අවසාන ලේඛනයෙන් නම ඉවත් කර ඇති බවයි. මෙම කාරණය සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු අනාවරණය කර ගැනීම රාජකීය විද්‍යාලයේ 2018 වර්ෂයේ අභියාචනා මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන ලද කොළඹ ලුම්බිණි විද්‍යාලයේ විදුහල්පති වෙත අවස්ථා කිහිපයකදීම සිතාසි නිකුත් කර ඇතත්, කිසිදු දැනුම්දීමකින්ද තොරව කොමිෂන් සභාව හමුවේ පෙනී සිටීම මගහැර ඇත.

**නිරීක්ෂණ හා නිගමනය :-**

ඒ අනුව මෙම කාරණා සම්බන්ධව තවදුරටත් සලකා බැලීමේදී, පැමිණිලිකාරිය වන කුමාරගේ දොන් යසින්තා කොහොමනී කුමාරගේ යන අයගේ පුත්‍රයා වන ටෙනුජ මෙත්විදු ජයතිලක 2018 වර්ෂයේ පළමු වසරට කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුලත් කිරීම සඳහා ගෘහ මූලික පදනම මත අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවත්, ඊට අදාළ සම්මුඛ පරීක්ෂණය සඳහා මුහුණ දී 22/2017 චක්‍රලේඛය ප්‍රකාරව

**ඡන්දය සඳහා** — **ලකුණු 30 ක්ද,**
**ඔප්පුව සඳහා** — **ලකුණු 30 ක්ද,**
**අතිරේක ලියකියවිලි** — **ලකුණු 05 ක්ද,** ලබාගෙන ඇති බව නිරීක්ෂණය වේ. වේ.

තමන්ගේ පදිංචි ස්ථානයේ සිට රාජකීය විද්‍යාලය අතර තිබෙන අනෙකුත් පාසැල් සඳහා (එක් පාසලකට ලකුණු 5 බැගින් පාසැල් 7 කට) ලකුණු 35 ක් කපා ඇති බවද නිරීක්ෂණය වන අතර, ඒ අනුව පැමිණිලිකාරිය මුළු ලකුණු 65 ක් උපයාගෙන ඇති බවද නිරීක්ෂණය වේ.

ඉන් අනතුරුව තාවකාලික ලැයිස්තුවේ 67 වන ස්ථානයේ ඇයගේ දරුවාගේ නම සදහන් වී ඇති අතර, පාසලට මෙම ගණය යටතේ ළමුන් ඇතුළත් කිරීමේ අවම ලකුණු වනුයේ ලකුණු 52.25 ක් වන බවද නිරික්ෂණය වේ.

මෙහිදී වගඋත්තරකාර පාසලේ නියෝජිතයා සහ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ නියෝජිතයා පරීක්ෂණ වලදී ඉදිරිපත් කල කරුණු වලට අනුව අභියාචනා මණ්ඩලයේ ස්ථානීය පරීක්ෂණයේදී මෙම පැමිණිලිකරුගේ ස්ථිර පදිංචිය තහවුරු නොමැති වීම මත අවසන් ස්ථිර ලේඛනයෙන් නම ඉවත් කර ඇති බව සදහන් කර ඇත. කෙසේ වෙතත් එම කාරණා සම්බන්ධව පරීක්ෂණයේදී වගඋත්තරකාර පාර්ශවය විසින් කිසිදු ආකාරයක තහවුරු කිරීමක් සිදු කර නොමැත. තවද අභියාචනා මණ්ඩලයේ සභාපතිවරයා සිතාසි මගින් පරීක්ෂණය සදහා පෙනී සිටින ලෙස 2018-07-02 සහ 2018-08-09 දිනයන්හි කියා සිටි අතර ඔහු කිසිදු දැනුම්දීමකින් තොරව කොමිෂන් සභාව හමුවේ පෙනී සිට නොමැත.

පැමිණිලි පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලේඛන පරීක්ෂා කිරීමේදී මෙම මුල් පැමිණිලිකාරියගේ කලත්‍රයා වන කිරිමදුන ආරච්චිගේ සමන් චින්තන ජයතිලක යන අයට 2004-03-10 වන දින ලියාපදිංචි වී ඇති තෑගි ඔප්පුවකින් මෙම ස්ථානය ලැබී ඇති බව නිරීක්ෂණය වේ. වරිපනම් අංක 251/33 ඩී, කිරුළ පාර, කොළඹ 05 යන මෙම ලිපිනයෙන් තවදුරටත් පැමිණිලිකාරියගේ ස්ථිර පදිංචිය තහවුරු කිරීම සදහා ඔවුන්ගේ පුත්‍රයාගේ උප්පැන්න සහතිකය, පැමිණිලිකාරියගේ කලත්‍රයා වන කිරිමදුන අරච්චිගේ සමන් චින්තන යනගේ උප්පැන්න සහතිකය, පැමිණිලිකාරියගේ පුත්‍රයාගේ සෞඛ්‍ය වර්ධන පොත, පැමිණිලිකාරියගේ සහ ස්වාමිපුරුෂයාගේ ජාතික හැදුනුම්පත්, පොලිස් වාර්තාව යන ලේඛන වලින් පැමිණිලිකාරියගේ පදිංචිය තවදුරටත් තහවුරු වන බව නිරීක්ෂණය වේ.

තවද පැමිණිලිකාරිය සහ ස්වාමිපුරුෂයා යන දෙදෙනාම රැකියා වල නියුතු පුද්ගලයින් නිසා සෑම වෙලාවේම ඔවුන් නිවසේ රැදී සිටීම බලාපොරොත්තු විය නොහැකි බවද කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි. එසේම පැමිණිලිකාරියගේ දියණියද මෙම ස්ථානයේ සිට කොළඹ විශාඛා විද්‍යාලය සහ පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයා මෙම ස්ථානයේ සිටම කොළඹ ඉසිපතන විද්‍යාලයට ඇතුලත් වී ඇති බවද වැඩිදුරටත් සදහන් වේ.

ඉහත කී කරුණු සලකා බැලීමේදී පැමිණිලිකාරිය මෙම ස්ථානයේ ස්ථිරව පදිංචි වී සිටීම වඩාත් පැහැදිලි වේ. තවද එක් වතාවක් ස්ථානීය පරීක්ෂණය සදහා අභියාචනා මණ්ඩලය විසින් ගිය බව හා එම අවස්ථාවේදී පැමිණිලිකාරිය නිවසේ නොසිටි බව පදනම් කරගෙන මෙම පැමිණිලිකාරියගේ පුත්‍රයාගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීම කිසිසේත්ම සාධාරණ නොවන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. තවද එම ස්ථානීය පරීක්ෂණයට අදාලව කිසිදු ලේඛනයක් සැපයීමට වගඋත්තර පාර්ශවය සමත්ව නැත.

ඉහත සමස්ථ කරුණු සලකා බැලීමේදී, පැමිණිලිකාරිය මෙම ස්ථානයේ ස්ථිරව පදිංචිය තහවුරු කර තිබියදීත් පැමිණිලිකාරියගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීම සහ අවසාන ලේඛනයෙන් නම ඉවත් කිරීම තුලින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට ආරක්ෂා කර දී ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

පැමිණිලිකාරියගේ දරුවා වන කේ.ජ්. වෙනුජ මෙත්විදු ජයතිලක දරුවා වගඋත්තරකාර කොළඹ රාජකීය විද්‍යාලයේ (2018 වර්ෂයේ පළමු වසරට) 2019 වර්ෂයේ දෙවන ශ්‍රේණියට ඇතුලත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

2019-02 -28 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම, නොවීම හෝ වර්තමාන තත්වය සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

B/..